Human Rights Commission of Sri Lanka
Library
No. 165, Kynsey Road,
Colombo 08.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2016-10-14 |

පැමිණිලිකාරිය : වයි.එච් දිසානායක මිය,
නො : 177/3/ඒ, බතලවත්ත පාර,
පල්ලේතලවින්න,
කටුගස්තොට.

වගඋත්තරකරුවන් : විදුහල්පතිනි,
මහ/උසස් බාලිකා විද්‍යාලය,
මහනුවර.

<u>පැමිණිලි අංකය : **HRC/K/47/16**</u>

පැමිණිල්ල :-

ඉහත නම් සඳහන් පැමිණිලිකාර පාර්ශවය 2016.01.21 දාතමින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, ආදි ශිෂ්‍ය පදනම යටතේ 2016 වර්ෂයේ පළමු ශ්‍රේණිය සඳහා වගඋත්තරකාර මහ/උසස් බාලිකා විද්‍යාලයට තම දරුවා වන පී.ජී.ඩී.එස් ගමගේ යන අය ඇතුළත් කර ගැනීම සඳහා 2015.06.17 වන දින අයදුම්පත් යොමු කර ලකුණු 60.5 ක ලකුණු ප්‍රමාණයක් උපයාගත් බවයි.

නමුත් තමා හට ලකුණු 62 ක ප්‍රමාණයක් ලැබිය යුතු බැවින් 2015.11.12 දින අභියාචනා පරීක්ෂණයට පෙනී සිටි නමුත් ආදි ශිෂ්‍ය සංගමයේ නියෝජිතවරියගේ අත්තනෝමතික ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමාගේ ලකුණුවල කිසිදු වෙනසක් නොකරන ලද බවට සඳහන් කර ඇත. නමුත් අභියාචනා පරීක්ෂණ මණ්ඩලය අදාළ චක්‍රලේඛන උල්ලංඝනය කරමින් විවිධ අයදුම්කරුවන්ට සුවිශේෂී වන සේ සිත් සේ ලකුණු ලබාදීමත් තමාට වඩා අඩු (ලකුණු 59) ඒ.එම්.එම්.කේ රත්නායක යන අයට අභියාචනයෙන් පසු නැවත 2015.12.01 දින කැඳවීම් කර සුවිශේෂී අවස්ථාවක් ලබා දී අසාධාරණ ලෙස ලකුණු 4.05 ක් ලබා දීමට කටයුතු කිරීමත්

හේතුවෙන් තම දරුවාට මෙම විද්‍යාලයට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි කර ඇති බවත් එය තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වන බවත් සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-**

වගඋත්තර පාර්ශවීය මහනුවර උසස් බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් සිය කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ මෙම පැමිණිලිකාරියගේ දියණිය ආදි ශිෂ්‍ය පදනම යටතේ 2015.09.03 වන දින පැවැති සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු 60.5 ක් ලබා ඇති බවත් 2015.11.12 දිනැති අභියාචනය සලකා බැලීමේදී ඇයට ලබා දී ඇති ලකුණු වල වෙනසක් සිදු නොවූ බවත්, ඒ සඳහා පැමිණිලි පාර්ශවය එකඟත්වය පළකර ඇති බවත්ය. එසේම පාසලේ 2016 පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගත් අවසන් ලකුණු සීමාව ලකුණු 61 ක් වන බැවින් පැමිණිලිකාරියගේ දරුවා පාසලට ඇතුළත් වීමට සුදුසුකම් ලබා නොමැති බවත් සඳහන් කර ඇත. ඒ අනුව පැමිණිලිකාරිය හට පහත පරිදි ලකුණු ලබා ඇති බවද· දක්වා ඇත.

| නිර්ණායකය | උපරිම ලකුණු | අනුමාන ලකුණු | ලබාගත් ලකුණු |
|---|---|---|---|
| අයදුම්කරු පාසල් අධ්‍යාපනය ලැබූ එක් පන්තියකට ලකුණු 02 බැගින් | 26 | 16 | 16 |
| පාසල් කාලය තුළ අයදුම්කරු විසින් ලබා ගත් අධ්‍යාපනික ජයග්‍රහණ | 25 | 11 | 9.5 |
| පාසල් කාලය තුළ අයදුම්කරු විසින් විෂය සමගාමී කටයුතුවලින් ලබාගත් ජයග්‍රහණ | 25 | 13 | 13 |
| ආදි ශිෂ්‍ය සංගම් සාමාජිකත්වය, පාසල් කාලයෙන් පසු ලැබූ අධ්‍යාපන ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා ලබාදුන් විවිධ ආකාරයේ සහයෝග | 24 | 22 | 22 |
| එකතුව | 100 | 62 | 60.5 |

**පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-**

දෙපාර්ශවයේ ලිඛිත සැලකිරීම් සලකා බැලීමෙන් පසු 2016.02.18 හා 2016.02.29 යන දෙදින මේ සම්බන්ධයෙන් දෙපාර්ශවය කැඳවා මූලික පරීක්ෂණ කටයුතු සිදුකර ඇති අතර, පැමිණිලි පාර්ශවයේ කරුණු ඉදිරිපත් කිරීමට අනුව පැමිණිලිකාරියගේ දරුවා 2016 පළමු වසරට ඇතුළත් කර ගැනීම සඳහා මහනුවර උසස් බාලිකා විද්‍යාලයට අයදුම්පතක් ඉදිරිපත් කර සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමෙන් පසු ලකුණු 60.5 ක් ලබා ඇති අතර මේ වන විට පොරොත්තු ලේඛනයේ පළමු ස්ථානයේ සිටින බව නිරීක්ෂණය වී ඇත.

එසේම පැමිණිල්ලේ දක්වා ඇති පරිදි ඒ.එම්.එම්.කේ රත්නායක යන අයට මුල් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ ලකුණු 59 ක් හිමිව ඇති අතර පොරොත්තු ලේඛනයේ නම ඇතුළත්ව නොමැති බවත් එම අයට අභියාචනා අවස්ථාවද ඊට අමතරව සුවිශේෂී අවස්ථාවක්ද ලබා දී (දුරකථන පණිවිඩ මඟින් කැඳවා) ලකුණු 63.5 ක් ලබා දී ඇති බව නිරීක්ෂණය වේ. එම අයදුම්කරු විසින් පහත පරිදි ලකුණු ලබාගෙන ඇත.

| නිර්ණායකය | උපරිම ලකුණු | අනුමාන ලකුණු | ලබාගත් ලකුණු | සුවිශේෂී ලකුණු |
|---|---|---|---|---|
| අයදුම්කරු පාසල් අධ්‍යාපනය ලැබූ එක් පන්තියකට ලකුණු 02 බැගින් | 26 | 14 | 14 | 14 |
| පාසල් කාලය තුළ අයදුම්කරු විසින් ලබා ගත් අධ්‍යාපනික ජයග්‍රහණ | 25 | 17½ | 17.5 | 18.5 |
| පාසල් කාලය තුළ අයදුම්කරු විසින් විෂය සමගාමී කටයුතුවලින් ලබාගත් ජයග්‍රහණ | 25 | 08 | 5.5 | 8 |
| ආදි ශිෂ්‍ය සංගම් සාමාජිකත්වය, පාසල් කාලයෙන් පසු ලැබූ අධ්‍යාපන ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා ලබාදුන් විවිධ ආකාරයේ සහයෝග | 24 | 23 | 22 | 23 |
| එකතුව | 100 | 62½ | 59 | 63.5 |

මේ අනුව ලකුණු පත්‍රිකා පරීක්ෂා කිරීමේදී,

- චක්‍ර ලේඛනයට අනුව ආදි ශිෂ්‍ය සංගමය විසින් සකස් කර ඇති ලකුණු පත්‍රිකාවේ II කොටසේ 04- vi අනුව ප්‍රශංශනීය වාර්තා/විශිෂ්ඨ ප්‍රතිඵල සඳහා සහතික වලට පැමිණිලි පාර්ශවයට ලකුණු 1.5 ක් ලබා දී ඇත. 1993 තුන්වන වාරයේ ප්‍රශංශනීය වාර්තාව ලකුණු 0.5 ක්ද, 1998 අ.පො.ස සා/පෙළ විශිෂ්ඨ ප්‍රතිඵල සහතිකය සඳහා ලකුණු 1 ක්ද වශයෙනි. මුල් සම්මුඛ පරීක්ෂණයේදී උ/පෙළ ප්‍රගති වාර්තාව සඳහා ලකුණු .5 ක්ද උ.පෙළ විශිෂ්ඨ ප්‍රතිඵල සඳහා ලකුණු 1 ක්ද වශයෙන් අනෙක් පාර්ශවය සඳහා ලකුණු 1.5 ක්ද ලබා දී ඇති බව නිරීක්ෂණය වේ. නමුත් පසුව ඒ සඳහා ඒ.එම්.එම්.කේ රත්නායක යන අයට අ.පො.ස (උ/පෙළ) දිස්ත්‍රික් මට්ටමට (District rank) නැවත ලකුණක් ලබා දී ඇති බව නිරීක්ෂණය වේ. එය ලකුණු පත්‍රිකාවේ නොමැති අමතර ලකුණු ප්‍රදානය කිරීමකි.

- එසේම ලකුණු පත්‍රිකාවේ iii-03 කොටසේ බාලදක්ෂිකා කටයුතු හෝ ශිෂ්‍යභට කටයුතු වලට හිමිවිය යුතු ලකුණු සඳහන්ව ඇතත් ඒ සඳහා ශාන්ත ජෝන්ස් සේවය එයට සමාන සේ සලකා ඒ.එම්.එම්.කේ රත්නායක යන අයට ලකුණු 02 ක් ලබා දීමට වගඋත්තර පාර්ශවය කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

- එසේම ලකුණු පත්‍රිකාවේ vi-03 කොටසේ පාසලෙන් පසු ලබාගත් අධ්‍යාපනික ජයග්‍රහණ වශයෙන්,

  1. වසරකට වැඩි ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලකුණු 1 ක්ද,
  2. පශ්චාත් උපාධි හෝ ආචාර්ය උපාධි සඳහා ලකුණු 02 ක්ද, ලබා දෙන බව දක්වා ඇති අතර ඒ සඳහා ලබා දෙන උපරිම ලකුණු 02 ක් වේ. ඒ.එම්.එම්.කේ රත්නායක යන අයගේ සුදුසුකම් ලෙස ඇය දක්වා ඇත්තේ වරලත් ගණකාධිකරණ අන්තර් මාධ්‍ය සහතිකය, CBA සහතිකය, VTA සහතිකය, ඩිප්ලෝමා සහතිකය වශයෙනි. එසේ වුවද එහිදී පැමිණිලි පාර්ශවයට එක් ලකුණක් ලබා දී ඇති අතර ඒ.එම්.එම්.කේ රත්නායක යන අයට පශ්චාත් උපාධියක් හෝ ආචාර්ය උපාධියක් නොමැතිව සිටියදී උපරිම ලකුණු 02 ක් ලබා දී ඇති නමුත් පැමිණිලි පාර්ශවයට ගණකාධිකරණ ශිල්පීය සුදුසුකමට ලකුණු ලබා දී නොමැති බව නිරීක්ෂණය වේ.

වගඋත්තර පාර්ශවය එක් පාර්ශවයක් වෙනුවෙන් එලෙස කටයුතු කළේ නම් පැමිණිලි පාර්ශවය වෙතද චක්‍රලේඛයේ 04-vi සඳහා දහම් පාසල් සහතික සඳහා ලකුණු 02 ක් ලබා දිය යුතු වේ. එනමුත් ශ්‍රේණි සහතිකයක් නොවීම මත පැමිණිලි පාර්ශවයට එකී ලකුණු ලබා දීමට කටයුතු

කර නොමැති බව නිරීක්ෂණය වේ. එසේ වුවද චක්‍රලේඛනයට අනුකූලව සකස් කර ඇති ලකුණු පත්‍රිකාවේ සඳහන්ව ඇත්තේ දහම් පාසල්, විවේකානන්ද, ඉස්ලාම්, ක්‍රිස්තියානි ආගමික කටයුතු සඳහා පාසල් කාලය තුළ ලද සහතික පත්‍ර යනුවෙනි. එහි ශ්‍රේණි සහතික ලෙස වර්ගීකරණයක් කර නොමැති බව නිරීක්ෂණය වන බැවින් පැමිණිලි පාර්ශවයට මේ සඳහා ලකුණු 02 ක් හිමි විය යුතු අතර එසේ නම් මුල් අවස්ථාවේදීම ඇයට හිමි ලකුණු ප්‍රමාණය 62.5 ක් වන බැවින් ඇයගේ දරුවාට මෙම පාසලට ඇතුළත් වීමට හිමිකම් ලැබෙන බව අනාවරණය වේ. එසේම වගඋත්තරකරු විසින් ලකුණු ලබා දීමේ පත්‍රිකාවට අනුකූලව ලකුණු ප්‍රදානය සිදුකළේ නම් ඒ.එම්.එම්.කේ රත්නායක යන අයද ඇයගේ අවසන් ලකුණු ලෙස දැක්වෙන ලකුණු 63.5 ලකුණු ප්‍රමාණය උපයා ගැනීමට අසමත් වන බවද නිරීක්ෂණය වේ.

නිගමනය :-

පැමිණිලිකාර වයි.එච් දිසානායක මහත්මිය තම දරුවා මහ/උසස් බාලිකා විද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා ආදි ශිෂ්‍ය පදනම යටතේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ලබා ඇති ලකුණු 60.5 පිළිබඳව සෑහීමට පත්වුවත් අභියාචනා මණ්ඩලය පසුව අදාළ නිර්ණායකයන් සඳහා අවිධිමත් ආකාරයට ලකුණු ලබා දීමෙන් පැමිණිලි පාර්ශවයට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් පොරොත්තු ලේඛනයේ නොමැති පාර්ශවයන් වෙත සුවිශේෂී ලෙස ලකුණු ලබා දීමට කටයුතු කිරීමෙන් පැමිණිලි පාර්ශවයට දැඩි අගතියක් සිදුකර ඇති බව කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇත.

එසේම පළමු වසරට ළමුන් ඇතුළත් කිරීමේ ක්‍රියාවලියේදී මෙම පැමිණිල්ලට අදාළ කරුණු සලකා බැලීමේදී විද්‍යාලයීය පරිපාලන ක්‍රියාවලිය අභිබවා ආදි ශිෂ්‍ය සංගමය කටයුතු කිරීම වැරදි පූර්වාදර්ශයක් ලබා දී ඇති බවද අනාවරණය වේ.

මේ හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට ආරක්ෂා කර දී ඇති "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය." යන පැමිණිලි පාර්ශවීය මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකාරියගේ දරුවා වන පී.ජී.ඩී.එස් ගමගේ යන අය 2016 වර්ෂයේ වගඋත්තරකාර විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කරගැනීමට පියවර ගත යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2017.01 .[illegible] දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka

පිටපත :-

1. ලේකම්, - අවශ්‍ය පියවර ගැනීම සඳහා
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

2. මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර.

B/